**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීති වේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2020/2021**

**පරිසර නීතිය - LLU5811/LWU3314**

**කාලය - පැය (03) තුනයි**

---

දිනයඃ 2021 සැප්තැම්බර් 13 වේලාවඃ පෙ.ව. 9.30 - ප.ව.12.30

---

උපදෙස් හොඳින් කියවන්න

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

**ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) කින් සමන්විත වේ. ඔබ ප්‍රශ්න හතරකට (04) කට පිළිතුරු සැපයිය යුතුය. <u>(A) කොටසේ ප්‍රශ්න අංක (1) අනිවාර්ය වේ. (B) කොටසින් ප්‍රශ්න තුනක් (3) ක් තෝරා ගත හැක.</u>**

## (A) කොටස

**මෙම ප්‍රශ්නය අනිවාර්ය වේ.**

**1.**

"චිරස්ථායි සංවර්ධනයට (අ) "ආර්ථික හා අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා , පාරිසරික සලකා බැලීම් සම්බන්ධ කර ගැනීම" සහ (ආ) "පාරිසරික වගකීම් සැකසීමේදී, අදාළ කිරීමේදී සහ අර්ථනිරූපණය කිරීමේදී , ආර්ථික හා සමාජ සංවර්ධනයේ අවශ්‍යතා සැළකිල්ලට ගැනීම පිළිබඳ අවශ්‍යතාවය" අයත් වේ."

Phillippe Sands, *Principles of International Environmental Law*

ශ්‍රී ලංකාවේ නීති දෙකක් (2) සහ අන්තර්ජාතික පාරිසරික සම්මුතීන් දෙකක් (2) ක් තෝරා ගෙන චිරස්ථායි සංවර්ධනයේ මෙම මූලිකාංග එකක් හෝ දෙකම කොපමණ දුරකට ඒවායේ සපුරා ඇත්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

## (B) කොටස

**මෙම කොටසින් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

**2.** 'ගෙම්මා' (Gemma) යනු ස්වභාවික සම්පත්වලින් පොහොසත් දූපත් රාජ්‍යයකි. නාගරාජ වනාන්තරය ලෙස හැඳින්වෙන ලෝක ප්‍රකට වනාන්තර විශාල ප්‍රමාණයක් මධ්‍යම පළාතේ ඇත. මෙම වනාන්තර ජෛව විවිධත්වයෙන් සුපෝෂිත නිවහනක් වන අතර ඒවා ජෛව විවිධත්වයේ ප්‍රමුඛ ස්ථාන ලෙසද වර්ගීකරණය කර ඇත. සැලකිය යුතු ආදිවාසී ජනගහනයක් ද වනාන්තරයේ වාසය කරති. සියවස් ගණනාවක් තිස්සේ නොවෙනස්ව පැවති ජීවන රටාවක් පවත්වාගෙන යන මෙම ආදිවාසීන් වනාන්තරවල ජෛව විවිධත්වය මත යැපෙමින් ජීවත් වෙති. ඔවුන් කලාතුරකින් බාහිර පුද්ගලයන් විසින් දැකිය හැකිය. නාගරාජ වනාන්තරය ලෝක උරුමයක් ලෙසද නම් කර ඇත.

ගෙම්මා හි මධ්‍යම පළාතේ නාගරාජ වනාන්තරයේ මායිම්ට තරමක් නුදුරින් බලශක්ති උත්පාදකාගාරයක් ආණ්ඩුව ඉදි කරන ලදි. මීට මාසයකට පෙර බලශක්ති උත්පාදකාගාරයේ ඇති වූ පිපිරීමක් හේතුවෙන් විශාල ගින්නක් ඇති වූ අතර එය වනාන්තරය දක්වා ව්‍යාප්ත විය. සතියක් පැවති ගින්න ගෙම්මා ඉතිහාසයේ සිදු වූ දරුණුතම ගින්න ලෙස විස්තර කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආදිවාසීන් 58 දෙනෙකු ජීවිතක්ෂයට පත් කරමින් තවත් සිය ගණනක් තුවාල ලබා රෝහල් ගත කර තිබේ. තත්ත්ව විශ්ලේෂණ වාර්තාවට අනුව (the situation analysis report) මෙම සිදුවීම හේතුවෙන් වනාන්තරවලින් සියයට 65 ක් විනාශ වී ඇති අතර ශාක හා සත්ත්ව විශේෂ ඇතුළුව ජෛව විවිධත්වයට විශාල හානියක් සිදු වී ඇත. තවද වනාන්තරය නැති වීම හේතුවෙන් ගෙම්මාහි, විශේෂයෙන්ම මධ්‍යම පළාතේ ජල මූලාශ්‍ර කෙරෙහි බලපෑමක් ඇති කරන බව ගෙම්මාහි විද්‍යාඥයෝ අනතුරු අඟවති. අනාදිමත් කාලයක සිට වනාන්තරයේ වාසය කළ ආදිවාසීන්ට දැන් නිවහන් නොමැති අතර ඔවුන්ගේ සාම්ප්‍රදායික ජීවන රටාව පවත්වා ගැනීමට නොහැකි වී ඇත.

පාරිසරික ක්‍රියාකාරීන්ගේ සංගමයක් වන 'හරිත සුරකින්නන්' (Save the Green) ස්වදේශීය ජනතාවට සහයෝගය දැක්වීමේ අපේක්ෂාවෙන් සිටී. ගෙම්මා හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන යැයි උපකල්පනය කර මෙම අවස්ථා යටතේ සාකච්ඡා කරන්න **(අ)** 'හරිත සුරකින්න' ට විපතට පත් ආදි වාසීන් වෙනුවෙන් නඩුවක් පැවරිය හැකිද? **(ආ)** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමන අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති ද? **(ඇ)** එම අයිතිවාසිකම් තවදුරටත් අර්ථ නිරූපණය කිරීම සහ බලාත්මක කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙය වීමේ මූලධර්මය උපුටා දැක්විය හැකිද ඒ කෙසේ ද?

ඔබේ පිළිතුර ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල අධිකරණ බලයන්හි අදාළවන ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරෙන් තහවුරු කරන්න . (ලකුණු 25)

**3.** 'ඕබිස්' (Orbis) යනු යනු පසුගිය කාලය තුළ දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දුන් සංවර්ධිත රාජ්‍යකි. ඕබිස් හි ආර්ථික ස්ථාවර භාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පෞද්ගලික හා විදේශීය ආයෝජන ආධාරයෙන් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කිරීමට ඕබිස් රජය තීරණය කළේය. 'ඕබිස් නැවතත් ශ්‍රේෂ්ටත්වයට පත් කිරීම' ලෙස මෙම මුලාරම්භයන් නම් කල අතර ,එයට  පහත සඳහන් පරිදි විස්තර කර ඇති සංවර්ධන ව්‍යාපෘති තුනක් ඇතුළත් වේ.

**(අ)** පළමු යෝජිත ව්‍යාපෘතිය නම්, ඕබිස් හි නැගෙනහිර වෙරළ තීරයේ වරායක් තැනීමයි. එම ප්‍රදේශය කොරල් පර සඳහා ලෝක ප්‍රසිද්ධ ස්ථානයකි. නිල් තල්මසුන් එම ප්‍රදේශයේ සිටීම හේතුවෙන් එය සාගර අභය භූමියක් ලෙසද ප්‍රකාශයට පත් කර ඇත. මෙම ප්‍රදේශයේ වෙසෙන ජනයා සංචාරකය සහ ධීවර කර්මාන්තයේ යේදීමෙන් මුදල් උපයති. ඕබිස් හි රජය වරාය පෞද්ගලීකරණය කර ,වසර 99 ක කල්බදු මත විදේශීය ආයෝජකයෙකුට පැවරීමට අදහස් කරයි.

**(ආ)** දෙවන ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාතේ සිට අගනුවර දක්වා අධිවේගී මාර්ගයක් සංවර්ධනය කිරීමට රජය තීරණය කළේය. යෝජිත මහා මාර්ගය ජාතික වනෝද්‍යානයක කොටසක් හරහා ගමන් කරන අතර එය සංක්‍රමණික පක්ෂීන්ගේ හා ආවේණික පක්ෂීන්ගේ වාසභූමියක් වේ. පුරාණ නගරයක නටබුන් ඇතැයි පුරාවිද්‍යාඥයන් විශ්වාස කරන ප්‍රදේශයකට ඉහළින් අධිවේගී මාර්ගයේ තවත් කොටසක් ඉදිකෙරෙනු ලැබේ.

**(ඇ)** තුන්වෙනි සංවර්ධන ව්‍යාපෘතිය ලෙස රටේ ඉහළම විරැකියා අනුපාතය ඇති ඕබිස් දකුණු පළාතේ නිදහස් වෙළෙඳ කලාපයක් ඉදිකිරීමට රජය තීරණය කළේය. එම නිදහස් වෙළෙඳ කලාපය සඳහා යෝජිත ඉඩමට රැම්සා අඩවියක් ලෙස නම් කර ඇති තෙත් බිමක්ද ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘති වල සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ඕබිස් රජය සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය විධිමත් ක්‍රියා පටිපාටි මග හැරීමට තීරණය කර ඇත.

මානව හිමිකම් හා සංවර්ධනය සඳහා වූ ව්‍යාපාරය (Movement for Human Rights and Development - MHRD) නම් වූ රාජ්‍ය නොවන සංවිධානයක් මෙම ව්‍යාපෘතිය අභියෝගයට ලක් කිරීමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකාවේ නීතිය ඕබිස්හි නීතිය හා සමාන බවත් , ශ්‍රී ලංකාව පිලිගත් සියලුම ජාත්‍යන්තර සම්මුතීන් ඕබිස්ද පිලිගෙන තිබේ යැයි උපකල්පනය කරන්න.

(ලකුණු 25)

**4.** 'ව්‍යාපාර මිතුරන්' (Friends in Business) යනු සුවඳ විලවුන් නිපදවන රසායනික කර්මාන්ත ශාලාවක් වන අතර 'ඔසෝ' හි අගනුවර ක්‍රියාත්මක වේ. එය ජනප්‍රිය සුඛෝපභෝගී සුවඳ විලවුන් සඳහා ප්‍රසිද්ධය.  එය සිය සැපයුම් විදේශ රටවල් දාහතරකට අපනයනය කරයි. සති අන්ත පුවත්පතක 'ව්‍යාපාර මිතුරන්ගේ නොදුටු පැත්ත' මැයෙන් මෑතකදී පළ වූ ලිපියක් මගින් 'ව්‍යාපාර මිතුරන්' ගේ ව්‍යාපාරික කටයුතු නිසා ඇතිවූ පරිසර දූෂණයෙන් පීඩාවට පත් වූවන්ගේ සාක්ෂි හා සටහන් සහිතව විස්තර කෙරිණි. එම ලිපිය මගින් මතු කළ කරුණු පහත දැක්වේ.

- කර්මාන්ත ශාලාව ආසන්නයේ පැල්පත් වල වාසය කරන 20,000 පමණ ජනයා කම්හලේ නිෂ්පාදන අපද්‍රව්‍ය තම මූලික ජල මූලාශ්‍රය වන කර්මාන්තශාලාව අසලින් ගලා බසින ඇළට බැහැර කරන බවට පැමිණිලි කරති. මේ හේතුවෙන් එහි ජලය බීමට අනාරක්ෂිත වී ඇත. මෙම ජලය පානය කිරීම හේතුවෙන් පැල්පත් වල සිටින බොහෝ දෙනකු මේ වන විටත් වමනය හා පාචනය වැනි රෝග වලින් පීඩා විඳිති.

- කර්මාන්ත ශාලාවෙන් පිටවන දැඩි රසායනික දුර්ගන්ධය නිසා වාතය දූෂණය වී නිවැසියන්ට ස්වසන අපහසුතා ඇතිවීම නිසා එයද මෙම ජනතාවට බාධාවකි. වැඩිහිටියන්ගේ සාක්ෂි වලට අනුව කර්මාන්තශාලාවෙන් පිටවන දැඩි රසායනික දුර්ගන්ධය නිසා ඔවුන්ට නින්දේ සහ දැඩි හුස්ම ගැනීමේ අපහසුතා ඇති වී තිබේ.

මෙම සිදුවීම වාර්තා කිරීම සඳහා වාර්තාකරු අදාළ බලධාරීන් සම්බන්ධ කරගත් විට කර්මාන්තශාලාව ක්‍රියාත්මක වන්නේ සියලුම අවසරයන් ඇතිව බවත් එම කර්මාන්තශාලාවෙන් ලැබෙන අපනයන ආදායම රටට ද වාසිදායක වන බවත් දැනුම් දුන් බව ඇය මෙම ලිපියේ සඳහන් කරයි. කර්මාන්තශාලාව අසල පැල්පත් වල වාසය කරන බොහෝ පුද්ගලයන් එහි රැකියාවල නියුක්තව සිටින බවද ඇයට පවසා ඇත. කර්මාන්ත ශාලාව මගින් එම ප්‍රදේශය ළමුන් සඳහා ප්‍රාථමික පාසලක් ද ස්ථාපිත කර ඇත.

මෙම ලිපිය කියවීමෙන් පසු, උද්ගතව ඇති නීතිමය ගැටලු පිළිබඳව පීඩාවට පත්වූ ජනතාවට සහ කර්මාන්තශාලාවේ කළමනාකාරීත්වයට ඔබ උපදෙස් දෙන්නේ කෙසේද?

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ තීරණයවූ නඩු නීතිය ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 25)

**5.** "අපේ පාරිසරික නීති විද්‍යාව ............ අපගේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය වටිනාකම් සහ මූලික අයිතිවාසිකම් මෙන්ම ජාත්‍යන්තර පාරිසරික මූලධර්ම සමඟද ගෙතෙමින් ඇත."

*Ashgar Leghari* v *Federation of Pakistan, 4 et 14 September 2015, W.P. No. 25501/2015*

මෙම උපුටා දැක්වීම ලංකාවේ පාරිසරික නීති විද්‍යාවට කොතෙක් දුරට අදාළ වේ යැයි ඔබ සිතන්නෙහි ද? නඩු නීතිය අදාළ කරගනිමින් සාකච්ඡා කරන්න. (ලකුණු 25)

***** හිමිකම් ඇවිරිණි *****